# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1796/23 – 2013 පෙබරවාරි 08 වැනි සිකුරාදා – 2013.02.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: මහ/3/312/අත්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සල්පිටි කෝරළේ සුලු කොට්ඨාසයේ, කොට්ටාව නැගෙනහිර ගමේ පිහිටි කොළඹ දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරේ අංක කො 9303 හි ප්‍රමාණයෙන් හෙක්. 0.0147ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: හොරහේනවත්ත; විස්තරය: ප්‍රවේශ මාර්ගය; හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0147.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මාර්තු මස 20 වැනි දින පු. භා. 9.30 ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 මාර්තු මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2013 පෙබරවාරි මස 07 වැනි දින,
මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 – 781

1A – G 17245 – 350 (2013/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*